


**"එම්බා මනුෂ්‍ය පුත්‍රය! මාගේ ප්‍රථම උපදේශය මෙයයි: පවිත්‍ර, කාරුණික හා දීප්තිමත් හදවතක් ඔබ සතු කරගන්න...."**




**“ඇත්ත වශයනේම, ඔබ දෙවියන්වහන්සේගේ යුක්තියේ මාර්ගයේ ගමන් කරන්න, ඍජු මාවත එයයි.”**



**“එම්බා මිත්‍රය! ඔබගේ හදවත් නමැති උද්‍යානය තුල ආදරයේ රොස මල් හැර අන්කිසිවක් නොසිටවන්න.”**



**“සත්‍යවාදී බව සියළුම මානුෂීය ගුණාංගයන්ගේ පදනමයි.”**




**“දීම සහ පරිත්‍යාගශීලි භාවය මාගේ ගුණාංගයන් වන අතර මාගේ ගුණාංගයන්ගෙන් සැරසෙන්නාට යහපතක්ම වේ.”**



**“තමාට ඉහළින් තම සහෝදරයා සලක තැනැත්තා ආශිර්වදලත් වෙති.”**



“එම්බා මනුෂ්‍ය පුත්‍රය! ඔබට මා මුණගැසීමට සහ මාගේ සුන්දරත්වය පිළිබිඹු කිරීමටත් හැකිවීමට යෝග්‍ය පරිදි ඔබගේ හදවතේ ප්‍රීතියෙන් සන්තෝෂයට පත්වන්න.”



**“අපි සෑම අවස්ථාවකදීම අපගේ සත්‍යවාදී බව සහ අවංකත්වය ප්‍රකාශයට පත් කළ යුතුය....”**



**“එම්බා මනුෂ්‍ය පුත්‍රය! මාහට ඔබ වෙත කරුණාවෙන් පැමිණිය හැකිවනු සඳහා ඔබ මා ඉදිරියේ නිහතමානී වන්න.”**



**“ඔබ ප්‍රීතියට පත්වන්න. ඔබ කෘතඥශිලී වන්න. වරප්‍රසාදයන් වර්ධනයවීමට උපකාරීවීම සඳහා ඔබගේ ස්තූතිවන්ත බව හේතුවන බැවින් දෙවියන්වහන්සේට ප්‍රශංසා කිරීම වෙනුවෙන් නැගී සිටින්න.”**



**“දෙවියන්වහන්සේගේ මනා ප්‍රියතමයින්ගේ හදවත් සතුටට පත් කරනු සඳහා ක්ෂමායුක්තබව සහ අනුකම්පාව ඔබගේ අලංකාරයවීමට ඉඩ දෙන්න.”**



**“එම්බා මිනිසුනි, සත්‍යවාදී බවෙන් ඔබගේ දිව අලංකාරවත් කර අවංකත්වයේ ආභරණයෙන් ඔබගේ ආත්මය සරසං ගන්න.”**



**“දෙවියන්වහන්සේගේ රාජධානිය ප්‍රතිස්ථාපිත වී ඇත්තේ සාධාරණත්වය සහ යුක්තිය මත මෙන්ම සෑම ජීවමාන ආත්මයකටම දක්වන දයාව, අනුකම්පාව සහ කරුණාව මතයි.”**




**“ඔබගේ සත්‍ය ආභරණය සමන්විත වන්නේ දෙවියන්වහන්සේගේ ප්‍රේමය සහ උන්වහන්සේ හැර අන් සියල්ලේන්ම වෙන්වීම තුල බව ඔබ දැන්ගන්න...”**




**“ස්වාමීන්වහන්සේ විසින් ප්‍රදාණය කරනලද ඕනෑම දෙයක් පිළිගැනීම සහ දෙවියන්වහන්සේ විසින් නියම කරන ලද දෙයින් තෘප්තිමත්වීම සෑම මහිමයකම උල්පත වේ.”**



**"සියළුම මිනිසුන් සමඟ උපරිම කරුණාවෙන් සහ ආදරයෙන් ඇසුරු කරන තැනැත්තා ආශිර්වාදලත් අයෙකු වේ."**



**“දෙවියන්වහන්සේගේ වචනය ප්‍රවර්ධනය කිරීම සහ උන්වහන්සේගේ ප්‍රේමය තුල ස්ථාවරත්වය ධෛර්යයේ සහ බලයේ ප්‍රභවය වේ.”**




**“කිසිවිටකත් දෙවියන්වහන්සේ කෙරෙහි ඇති ඔබගේ විශ්වාසය නැතිකර නොගන්න. මනුෂ්‍ය වර්ගයා කෙරෙහි ඇති දෙවියන්වහන්සේගේ නොනවතින වරප්‍රසාදයන් මත ඔබ බලාපොරොත්තු සහගත වන්න.”**



**“මනුෂ්‍ය වර්ගයා ශාන්තභාවයේ සහ ආරක්ෂව වෙතට ඔසවා තවන උසස්තම රාමුව වන්නේ විශ්වාසවන්තභාවයයි.”**



"එම්බා මිනිසුනි, අන් අයගේ හදවත් ඔබට දැල්විය හැකිවන පරිදි දෙවියන්වහන්සේගේ ප්‍රේමයෙන් ඔබගේ හදවත් දල්වාගත් අයෙකු වන්න."




**“එම්බා සත්ව පුත්‍රය! ඔබ මාගේ පවහන වනසේම මාගේ ආලෝකය ඔබ තුල පවතී. ඔබගේ දීප්තිය එයින් ලබාගෙන මා හැර අන්කිසි කෙනෙකු නොසොයන්න.”**



“උසස් උත්සාහයන්ගේ වස්ත්‍රාභරණයෙන් සැරසෙන සහ මෙම ධර්මය සඳහා සේවය කිරීමට නැඟී සිටින විශ්වාසවන්ත තැනැත්තා ප්‍රීතියට පත්වේ.”



**"නියතවශයෙන්ම උන්වහන්සේ ඉවසීමෙන් විඳදරාගන්නා අයගේ ත්‍යාගයන් ඉහළ නංවනු ඇත."**



“ඔබ ඔබගේ ස්වාමීන් වහන්සේගේ ධර්මයේ ස්ථිරසාර භාවයෙන් සිටින්නේ නම් ඔබගේ තත්වය ශ්‍රේෂ්ඨ උදාර වනු ඇත.”